Australian Electoral Commission

AEC

Sinhalese/සිංහල

# ඔබේ නිල උපදෙස් පෙළ

## 2022 මහ මැතිවරණය සඳහා

**2022 මැයි 21 සෙනසුරාදා**

**චන්දය භාවිතාව අනිවාර්යයි**

වයස අවුරුදු 18ට හා ඊට වැඩි ඔස්ට්‍රේලියානු පුරවැසියන් සඳහා



## ඔබේ චන්දය ඔස්ට්‍රේලියාවෙහි හැඩගැස්වීමට දායකවනු ඇත

# මැතිවරණ කොමසාරිස්වරයාගේ **පණිවුඩය**

මෙම උපදෙස් පෙළ AEC මගින් සකසා ඇත්තේ ඔබට මෙවර මහ මැතිවරණයේදී ඔබේ චන්දය සැලසුම් කරගැනීමට උපකාරීවනු පිණිසය. උපදෙස් පෙළ නිවැරදිව චන්දය ලකුණු කරන අයුරු, චන්දය ප්‍රකාශ කරන ස්ථානයන්හි සිදුවන්නේ කුමක්ද, නිතර අසනු ලබන ප්‍රශ්ණ හා තොරතුරු මූලාශ්‍ර පිරික්සීමට අවශ්‍ය උපදෙස් යනාදිය විස්තර කරයි.

සිය ස්ථාවරය ප්‍රකාශ කිරීමට ප්‍රජාවට සහය වන අතරම අනෙකුත් චන්ද විකල්පයන්ද සමගින් චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් රට පුරා මැතිවරණ දිනයෙහිදී අප විවෘතව තබන්නෙමු.

**ඔබට පහත දෑ පිළිබඳ විශ්වාසය තහවුරු වනු ඇත:**

- චන්ද පත්‍රිකාව - මුද්‍රණයේ සිට ගණන්කිරීම දක්වා ඔබේ චන්දය එකී ක්‍රියාදාමයේ සෑම පියවරකදීම සුරකින **අද්විතීය** මැතිවරණ ක්‍රියාදාමයක් අප එළිදක්වන්නෙමු.
- ඔබේ සහ අප මැතිවරණ කාර්යමණ්ඩලයේ **සෞඛ්‍යය හා ආරක්ෂාව**, ප්‍රමුඛතාවයක් වන අතර, පරාසයක COVID-19 ආරක්ෂිත මෙහෙයුම් සැලසෙනු ඇත.

අදහස්වල ශක්තිමත් හුවමාරුව මැතිවරණයේ කොටසක් වන අතර, ඔබ ලබන සෑම තොරතුරක්ම, විශේෂයෙන්ම අපේ මනා ලෙස ස්ථාපිත මැතිවරණ ක්‍රියාදාමය ප්‍රශ්ණයට ලක්කෙරෙන යමක් නම්, එය සුපරීක්ෂාකාරීව සලකා බලන ලෙසත් මා ඔබ දිරිමත් කරමි. **එය හඳුනාගත හැකි සහ විශ්වසනීය මාර්ගයකින්ද යන්න ඔබෙන්ම විමසන්න.** පිළිතුර නැත යන්න නම්, මගේ යෝජනාව වන්නේ පරිස්සම්වන්න යන්නයි.

මේ මැතිවරණයේදී ඔබේ මතය තහවුරු කල හැකි අයුරු පිළිබඳ වැඩිමනත් තොරතුරු සඳහා **aec.gov.au** වෙත පිවිසෙන්න.

**Tom Rogers**
මැතිවරණ කොමසාරිස්

මැතිවරණ ලේඛණය මත
**96%** කට වඩා

චන්දය ප්‍රකාශ කරන ස්ථාන
**7,000+**

පෙර චන්ද ප්‍රකාශ මධ්‍යස්ථාන
**500+**

තාවකාලික මැතිවරණ සේවකයින්
**100,000+**

# නැවතී සලකා බලන්න
## මෙවර මහ මැතිවරණය පිළිබඳ මූලාශ්‍ර පිරික්සන්න

මහ මැතිවරණයක් අතරතුර ඔබේ චන්දයට බලපෑම් කිරීමට තැත්කරන, විශාල ප්‍රමාණයක තොරතුරු බෙදාහරිනු ඇත.

මෙය ප්‍රජාතාන්ත්‍රික ක්‍රියාවලිය තුල අත්‍යවශ්‍ය සාධකයකි. එය අපේක්ෂකයින්ට, දේශපාලන පක්ෂවලට සහ අනෙකුත් අයට චන්දදායකයින් හා ඔවුන්ගේ ප්‍රතිපත්ති හා විශ්වාසයන් පිළිබඳ අදහස් හුවමාරු කරගැනීමට මග සළසනු ඇත.

කෙසේ වෙතත්, සමහරක් තොරතුරු හිතාමතාම සාවද්‍ය හෝ නොමග යවන සුළු ඒවා විය හැක.

මහ මැතිවරණය පිළිබඳ ඔබ දකින, අසන හෝ කියවන දෑ සුපරීක්ෂාකාරීව සලකා බැලීම වැදගත්ය.

තොරතුර පහත දැක්වෙන අයුරු බව තහවුරු කර ගැනීමට කාලය වැය කරන්න:

- විශ්වාසදායක හෝ හඳුනාගත හැකි මාර්ගයකින් බව
- කාලීන
- ආරක්ෂිත (වංචාවක් නොවන).

මෙය සමාජ මාධ්‍ය සහ මාර්ග ගත අවස්ථාවලදී විශේෂයෙන් වැදගත් වේ.

වැඩිදුර සහ ප්‍රයෝජනවත් තොරතුරු සහිත කෙටි වීඩියෝ සඳහා **aec.gov.au/stopandconsider** වෙත පිවිසෙන්න.



# 2022 මැයි 21 සෙනසුරාදා මැතිවරණ දිනයයි

## චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් පෙ.ව.8 ට විවෘත වන අතර ප.ව.6 ට අනිවාර්යයෙන් වසනු ලැබේ.

මහ මැතිවරණයක් පවත්වනු ලබන්නේ ඔස්ට්‍රේලියානුවන්ට සෙනෙට් සභාවේදී හා නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේදී තම අදහස් හා අවශ්‍යතා නියෝජනය කිරීමට සභිකයන් තෝරා පත්කර ගැනීමටය.

### ඡන්දය දිය යුත්තේ කවුද?

අවුරුදු 18ක් හා ඊට වැඩි වයසේ සියලු ඔස්ට්‍රේලියානු පුරවැසියන් ලියාපදිංචි විය යුතු අතර මහ මැතිවරණයන්හිදී චන්දය ප්‍රකාශ කල යුතුය.

### මා හට චන්දය ප්‍රකාශ කළ හැක්කේ කොතැනදීද?

මැතිවරණ දිනයෙහිදී ඔබේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ ඕනෑම චන්දය ප්‍රකාශ කරන ස්ථානයක ඔබට චන්දය ප්‍රකාශ කල හැක. චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් පෙ.ව.8 සිට ප.ව.6 දක්වා විවෘතව පවතී.

චන්දය ප්‍රකාශ කරන ස්ථානයන් සාමාන්‍යයෙන් ප්‍රාදේශීය පාසල්, පල්ලි සහ ප්‍රජා ශාලා, හෝ පොදු ගොඩනැගිලිවල ස්ථානගත කර ඇත. ඔබට ආසන්නම චන්දය ප්‍රකාශ කරන ස්ථානය සොයා ගැනීමට **aec.gov.au/where** වෙත පිවිසෙන්න.

ඔබට ගමන් අවහිරතාවන් හෝ දුබලතාවන් ඇත්නම්, හෝ එවැන්නෙකු රැකබලා ගන්නෙකු නම්, චන්දය ප්‍රකාශ කරන ස්ථානයන්ට ළඟාවිය හැකි අයුරු පිළිබඳ තොරතුරු **aec.gov.au/where** මගින් සොයා දැනගත හැක.

දෘශ්‍යාබාධිත හෝ මන්ද දෘශ්‍යාබාධිත චන්ද ප්‍රකාශකිරීමේ විකල්පයින් සඳහා කරුණාකර **aec.gov.au/assistance** වෙත පිවිසෙන්න නැතිනම් අංක **13 23 26** අමතන්න.

### මා වෙනත් ප්‍රාන්තයක හෝ ටෙරිටරියක සිටී නම්?

මැතිවරණ දිනයෙහිදී ඔබ ප්‍රාන්ත අතර සිටීනම් ඔබට නම්කරන ලද අන්තර්ප්‍රාන්ත චන්ද මධ්‍යස්ථානයක චන්දය ප්‍රකාශ කල හැකි අතර, වේලාසනින් චන්දය ප්‍රකාශකිරීමේ විකල්පයන්ද සලකා බැලිය හැක.

### මැතිවරණ දිනයේදී මා හට පැමිණිය නොහැකි නම්?

ඔබට මැතිවරණ දිනයේදී ඔබේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියෙහි චන්ද පොලකට යා නොහැකි නම්, ඔබ පුද්ගලිකව හෝ තැපැල් මගින් චන්දය ප්‍රකාශකිරීමට සුදුසුකම් ලබනු ඇත.

### වේලාසනින් පුද්ගලිකව චන්දය ප්‍රකාශ කරන අයුරු

ඔබ සුදුසුකම් සපුරයි නම්, ඔබට මැතිවරණ දිනයට පෙර චන්දය ප්‍රකාශ කල හැක. පූර්ව චන්ද මධ්‍යස්ථානයන් **2022 මැයි 9 සඳුදා** සිට විවෘතයි. විවෘත කරන දිනයන් හා වේලාවන් වෙනස්වන බැවින් **aec.gov.au/where** වෙත පිවිස සියලු මධ්‍යස්ථානයන්හි තොරතුරු සොයා බලන්න.

වේලාසනින් තැපැල් මගින් චන්දය ප්‍රකාශ කිරීම හා ඒ සඳහා ඔබ සුදුසුකම් ලබයිද යන්න පිළිබඳව **aec.gov.au/early** වෙත පිවිස හෝ **13 23 26** අමතා සොයා බලන්න.

### වේලාසනින් තැපැල් මගින් චන්දය ප්‍රකාශ කරන අයුරු

සුදුසුකම් ලබන චන්දදායකයන්හට තැපැල් චන්දය භාවිතා කල හැකිය. **aec.gov.au/pva** වෙතින් ඔබේ සුදුසුකම් සොයා බලා මාර්ග ගතව අයදුම් කරන්න.

**2022 මැයි 18 බදාදා ප.ව. 6 ඉක්මවීමට පෙර** AEC වෙත ලැබෙන පරිදි තැපැල් චන්දය සඳහා වන අයැදුම්පත සම්පූර්ණ කරන්න.

මාර්ග ගත ප්‍රවේශයක් නොමැති නම් සහ ඔබට තැපැල් චන්දයක් සඳහා අයැදුම්කිරීමට අවශ්‍ය නම් **13 23 26** අමතන්න.

### මා කුමන මැතිවරණ කොට්ඨාශයට අයත්ද?

කුමන මැතිවරණ කොට්ඨාශයක ඔබ ජීවත්වන්නේද යන්න **aec.gov.au/electorate** වෙතින් සොයාගත හැකිය.

ඔබ **බටහිර ඔස්ට්‍රේලියාව** හෝ **වික්ටෝරියාහි** ජීවත්වන්නේ නම්, ඔබේ මැතිවරණ කොට්ඨාශයේ නම හෝ මායිම් පසුගිය මැතිවරණයෙන් පසු නැවත සළකුණු කිරීමකට ලක්වන්නට ඇත. ඔබට වෙනත් කොට්ඨාශයක චන්දය ප්‍රකාශකිරීමට අවශ්‍යවනු හෝ ඔබේ සාමාන්‍ය චන්දය ප්‍රකාශකරන ස්ථානය වෙනස් කොට්ඨාශයක පැවතීමට ඉඩකඩ ඇත.

### ඔබ චන්දය ප්‍රකාශ කරන්නේ කාහටද යන්න ඔබේ තීරණයයි

චන්ද මධ්‍යස්ථානයන්හි පිටතදී, අපේක්ෂක නියෝජිතයින්, චන්දය ප්‍රකාශ කල හැක්කේ කෙසේද යන, යම් අයුරකට චන්දය ප්‍රකාශ කිරීමට දිරිදෙන කාඩ්පත් ඔබට පිරිනමනු ඇත. ඔබ ඒවා භාරගැනීමට හෝ චන්දය ප්‍රකාශ කල හැක්කේ කෙසේද යන කාඩ්පත් අනුගමනය කිරීමට අවශ්‍ය නැත.

වෙනත් ප්‍රශ්ණ තිබේද?
**aec.gov.au/faqs**
වෙත පිවිසෙන්න




# ඔබේ චන්දය වලංගුකර ගත හැකි අයුරු

මැතිවරණ දිනයෙහිදී ඔබට නියෝජිත මන්ත්‍රී මණ්ඩලය සඳහා කොළ පැහැති කුඩා එකක්ද, සෙනෙට් සභාව සඳහා සුදු පැහැති විශාල එකක්ද වශයෙන් චන්ද පත්‍රිකා දෙකක් ලැබෙනු ඇත. **ඔබ චන්ද පත්‍රිකා දෙකම සම්පූර්ණ කල යුතුමය.** කොළ පැහැති චන්ද පත්‍රිකාවේ, නියෝජිත මන්ත්‍රී මණ්ඩලයට නගරබද ප්‍රදේශයේ හෝ මැතිවරණ කොට්ඨාශයේ නියෝජිතයකු සඳහා ඔබ චන්දය භාවිතා කරයි. සුදු පැහැති චන්ද පත්‍රිකාව මත, ඔබේ ප්‍රාන්තයේ හෝ ටෙරිටරියේ සෙනෙට් සභාවේ නියොජිතයන් සඳහා ඔබ චන්දය ප්‍රකාශ කරයි.

## නියෝජිත මන්ත්‍රී මණ්ඩලය

කොල පැහැති චන්ද පත්‍රිකාව මත, ඔබේ මනාපය පරිදි, **සියලුම කොටු අංකනය කරන්න.**




චන්ද පත්‍රිකා නියැදිය

**අත්වැරැද්දක් සිදුවුවද කලබල නොවන්න.** ඔබට නව චන්ද පත්‍රිකාවක් ඉල්ලාගෙන මුල සිට පටන්ගත හැකිය.

## සෙනෙට් සභාව


සුදු පැහැති චන්ද පත්‍රිකාවේ චන්දය ප්‍රකාශකිරීමට දෙආකාර මනාපයන් ඔබට ඇත:

**එක්කෝ**

### සීමා රේඛාවට ඉහලින්

රේඛාවට ඉහළින් චන්දය ප්‍රකාශකිරීමට ඔබ තීරණය කළහොත්, **අවම වශයෙන් කොටු 6ක් ඔබ අංකනය කළ යුතුය.**

ඔබේ පළමු මනාපය හිමි පකෂය හෝ කණ්ඩායම සඳහා ඇති කොටුවෙහි ‘1’ ද දෙවැනි මනාපයට අයත් කොටුවෙහි ‘2’ ලෙසින්ද අවම වශයෙන් කොටු 6ක් ඔබ අංකනය කළ යුතුය. රේඛාවට ඉහලින් කැමති කොටු ප්‍රමාණයක ඔබට දිගටම අංක ලකුණු කළ හැක.





චන්ද පත්‍රිකා නියැදිය

**නැතහොත්**

### සීමා රේඛාවට පහලින්

රේඛාවට පහළින් ඡන්දය ප්‍රකාශකිරීමට ඔබ තීරණය කළහොත්, 1 සිට 12 දක්වා පුද්ගලික අපේක්ෂකයින් සඳහා ඔබේ මනාපය අනුව **අවම වශයෙන් කොටු 12ක්** ඔබ අංකනය කළ යුතුය. රේඛාවට පහලින් කැමති කොටු ප්‍රමාණයක ඔබට මනාප පරිදි දිගටම අංක ලකුණු කළ හැක.




චන්ද පත්‍රිකා නියැදිය

AEC වෙබ් අඩවියේ චන්දය ප්‍රකාශකිරීමට ඔබට පුහුණු විය හැකි බව ඔබ දැනසිටියාද?
**aec.gov.au/practise** වෙත පිවිසෙන්න.

# චන්දය ප්‍රකාශකිරීමට පෙර **ඔබට සැලසුම් කල හැක්කේ මෙනවාද**

**BE COVIDSAFE**

ඔබට චන්දය ප්‍රකාශකරන අතර ඔබත් අන්අයත් සුරක්ෂිත කිරීමට පියවර ගත හැක.

- **කෝවිඩ්-19 රෝග ලක්ෂණ ඇත්ද? චන්ද පොල වෙත නොඒම පිළිබඳව ස්තුතියි.**
- අසනීප නම්, තැපැල් චන්දයක් සඳහා ඔබ සුදුසුකම් ලබනු ඇත. **ඔබට 2022 මැයි 18 බදාදා පව 6 දක්වා aec.gov.au/pva** මගින් මාර්ග ගතව අයැදුම් කල හැකිය.
- සහභාගීවීමට පෙර අපේක්ෂකයින් හා මනාපයන් පිළිබඳව සොයා බලන්න. අපේක්ෂක ලැයිස්තුව **aec.gov.au/election/candidates.htm** හි ඇත.
- හැකි සෑම විටෙකම නියත වශයෙන්ම චන්දය ප්‍රකාශ කරන පුද්ගලයා පමණක් චන්දපොලට පැමිණිය යුතුය.
- චන්දය ප්‍රකාශ කරන ස්ථානයන්හි හෝ ඒවා අවට සම්භාෂණයන්ගෙන් සහ අමතර කාලය ගත කිරීමෙන් වළකින්න.

නවතම යාවත්කාලීන තොරතුරු හා උපදෙස් සඳහා **aec.gov.au/covid-safety** වෙත පිවිසෙන්න

# චන්දය ප්‍රකාශ කරන ස්ථානයේදී කුමක් සිදුවේද?

## චන්දය ප්‍රකාශ කිරීමේ පියවර

1. ඡන්ද නිලධාරීන් ඔබේ සම්පූර්ණ නම සහ ලිපිනය, සහ මේ මහ මැතිවරණයේදී මීට පෙර ඔබ චන්දය ප්‍රකාශ කලේද යන්න අසනු ඇත. ඔබේ නම ඉන්පසු චන්ද ලේඛණයෙන් කපා හරිනු ලබනු ඇත.
2. ඔබේ චන්ද පත්‍රිකාව ඔබට ලබාදෙනු ඇත.
3. චන්දය ප්‍රකාශ කරන ස්ථානයේදී, චන්ද පත්‍රිකාවල ඇති උපදෙස් හොඳින් කියවන්න. නැතහොත් චන්ද නිලධාරීන්ගේ සහය පතන්න.
4. ඔබේ චන්ද පත්‍රිකාව සම්පූර්ණ කරන්න.
5. ඔබේ චන්ද පත්‍රිකාව නවා චන්ද පෙට්ටි තුලට දමන්න.

## කෝවිඩ්–19 පාලනයට සලසා ඇති ආරක්ෂිත මෙහෙයුම්

- ඕනෑම විටෙක චන්දය ප්‍රකාශ කරන ස්ථානයක් තුල සිටිය හැකි චන්දදායකයින්ගේ සීමාවක් තිබිය හැක. පිටත පෝලිම් ගැසෙන ලෙස ඔබෙන් ඉල්ලා සිටිය හැක.
- ඇතුලත හා පිටත එකිනෙකා අතර මීටර 1.5ක පරතරයක් තබාගෙන, චන්ද පොල ඇතුලතදී පොළොවෙහි ඇති මග සළකුණු අනුගමනය කරන්න.
- QR කේතය භාවිතාකොට හෝ කායිකව පැමිණීම වාර්තා කරන්න.
- ඔබේ ප්‍රදේශයේ මුහුණු ආවරණ අවශ්‍යතාවන් පිළිපදින්න.
- සපයා ඇති අත් විෂබීජහරණයන් පාවිච්චි කරන්න.
- චන්ද පොලවල් සහ පැන්සල් නිරන්තරයෙන් ශුද්ධ පවිත්‍ර කරණු ලැබේ. කැමතිනම් ඔබේ පෑන හෝ පැන්සල රැගෙන එන්න, එහෙත් එය අමතක කර නොයන්න.




**මීටර 1.5 ක් පරතරයකින් සිටගන්න.**



**යම්කිසි කෝවිඩ්-19 රෝග ලක්ෂණ ඇත්නම් නිවසේ රැඳෙන්න.**



**ඔබේ කැස්ස සහ කිවිසුම් ආවරණය කරන්න**



**මුව ආවරණ අවශ්‍යතා පිළිබඳව සොයා බලන්න**



**සපයා ඇති අත් විෂබීජහරණ පාවිච්චි කරන්න**

ඔබේ ප්‍රාදේශීය ප්‍රාන්ත සහ ටෙරිටරි රජයයන්ගේ කෝවිඩ්-19 සෞඛ්‍ය උපදෙස් පෙල අනුගමනය කිරීම වැදගත් වේ. මෙකී උපදෙස් පෙල සඳහා වන සබැඳියාවන් **aec.gov.au/covid-safety** හි ඇත.

මෙකී උපදෙස් පෙලෙහි ඇති තොරතුරු මුද්‍රණ අවස්ථාවේ පවතින තත්වයන් නිරූපනය කරයි. මධ්‍යම රජයේ සහ ප්‍රාන්තයන්හි සෞඛ්‍ය බලධාරීන්ගේ උපදෙස් AEC දිගින් දිගට අනුගමනය කරනු ඇති අතර යාවත්කාලීන කල පියවර අප වෙබ් අඩවියෙහි දැක්වෙනු ඇත.

# **ඔබේ නිල උපදෙස් පෙල** 2022 මහ මැතිවරණය සඳහා

## 2022 මැයි 21 සෙනසුරාදා

# මේ උපදෙස් පෙලෙහි **විකල්ප ආකාරයන්**

### ලබාගත හැකි ආකෘතීන් පිළිබඳ තොරතුරු

මේ උපදෙස් පෙලෙහි ශ්‍රව්‍ය හා විශාල මුද්‍රිත වැනි විකල්ප ආකෘතීන් බාගත කරගැනීම **aec.gov.au/assistance** මගින් කල හැකිය.

**13 23 26** අමතා අයදුම්කිරීම මගින් බ්‍රේල් ද ලබාගත හැකිය.

ඔබට ශ්‍රව්‍යාබාධ හෝ යම් ශ්‍රව්‍ය හෝ කතාකිරීමේ ආබාධයක් ඇත් නම් National Relay Service (NRS) හරහා අප අමතන්න:

- TTY ග්‍රාහකයින් **13 36 77** අමතා **13 23 26** සඳහන් කරන්න.
- Speak and Listen ග්‍රාහකයින් **1300 555 727** අමතා **13 23 26** සඳහන් කරන්න.
- Internet relay ග්‍රාහකයින් NRS හා සම්බන්ධවී **13 23 26** ඉල්ලා සිටින්න.
- Auslan භාෂණ පරිවර්තන සේවාවන්ද ලබාගත හැක. තවදුරටත් තොරතුරු සඳහා AEC වෙබ් අඩවියට පිවිසෙන්න.

### අනෙකුත් භාෂාවලින් තොරතුරු

**මේ උපදෙස් පෙලෙහි භාෂා 33 ක පරිවර්තිත පිටපත් aec.gov.au/translated වෙතින් බාගත කල හැක.**

දුරකතන භාෂණ පරිවර්තන සේවාවන්ද ඇත. චන්දය භාවිතා කිරීම සහ මැතිවරණ පිළිබඳව තොරතුරු සඳහා **1300 720 153** අමතා ඔබේ භාෂාව ඉල්ලා සිටින්න.




වයස අවුරුදු 18ට හා ඊට වැඩි ඔස්ට්‍රේලියානු පුරවැසියන් චන්දය භාවිතා කිරීම අනිවාර්යය වේ. ඔබ චන්දය භාවිතා නොකලහොත්, ඔබට විරුද්ධව නඩු පැවරිය හැක. ඔබ චන්දය වරකට වඩා භාවිතා කලහොත්, එය අපරාධ වරදකි.



මැතිවරණ කොමසාරිස්වරයා ගේ අනුමැතිය පරිදිය, 10 Mort Street, Canberra.
Authorised by the Electoral Commissioner, 10 Mort Street, Canberra.